# ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)

## කෘෂිකර්ම අමාත්‍යාංශය

# ඇබෑර්තු (කොන්ත්‍රාත් පදනමින්)

**ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය (කොන්ත්‍රාත්)

මෙම තනතුර හොබවන අය, ප්‍රතිපත්ති විධිමත්ව සකස් කිරීම, කාර්යාල උපදේශකත්වය හා මූල්‍ය සැළසුම්, අයවැය පාලන කටයුතු, ගිණුම්කරණය, පිරිවැය හා මූල්‍ය වාර්තාකරණය, ණය හා එකතුකිරීම්, බැංකුකරණ හා මුදල් කළමනාකරණය, විගණනය හා රක්ෂණය සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වෙත තොරතුරු ලබාදීම සම්බන්ධව වගකීම් දරයි. එසේම, විගණකාධිපති කාර්යාලය, අමාත්‍යාංශය, දේශීය ආදයම් දෙපාර්තමේන්තුව හා බැංකු සමග සම්බන්ධීකරණය කළ යුතුය. මූල්‍ය වාර්තා, වාර්ෂික අයවැය නියමිත කාලයට හා නිවැරදිව සකස් කළ යුතු අතර, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ස්ථාවර මූල්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා අධීක්ෂණය කිරීමේ වගකීම දරයි.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගණකාධිකරණ / වාණිජ්‍ය / ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන / රාජ්‍ය පරිපාලන / රාජ්‍ය කළමනාකරණ ප්‍රථම උපාධියක් හෝ කළමනාකරණ උපාධියක්,

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) සාමාජිකත්වය

**හෝ**

මහා බ්‍රිතාන්‍යයේ කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) සාමාජිකත්වය

**හෝ**

මහා බ්‍රිතාන්‍යයේ වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA) සාමාජිකත්වය

**සහ**

කළමනාකරණ හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) සමග, රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික අංශයේ ආයතනයක, කළමනාකරණ තලයේ, සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වසර පහළොවක (15) පළපුරුද්ද.

## 02. සහකාර කළමනාකරු - මූල්‍ය (කොන්ත්‍රාත්)

මණ්ඩලයේ මූල්‍ය ක්‍රියාකාරකම් මෙහෙයවීම, අතිත් ක්‍රියාත්මක හා පරිගණක පද්ධති සඳහා මූල්‍ය පාලන ස්ථාපිත කිරීම, බැංකු ගිණුම්වල බැංකු ශේෂ අධීක්ෂණය හා ගෙවුම් පාලනය, අංශවල ආදයම් හා ප්‍රාදේශීය ජාල අධීක්සණය, විවිධ අංශ සම්බන්ධව විවිධ මූල්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කොට, සුමටව හැඩගස්වා, පරිගණකගත කිරීම, විගණකාධිපති කාර්යාලය, අමාත්‍යාංශය, දේශීය ආදයම් දෙපාර්තමේන්තුව හා බැංකු සමග සම්බන්ධීකරණය, මූල්‍ය වාර්තා කාලානුරූපව හා නිවැරදිව සකස් කොට ඉදිරිපත් කිරීම හා වාර්ෂික අයවැය සකස් කිරීම සඳහා කටයුතු කළ යුතුය.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගණකාධිකරණ / වාණිජ්‍ය / ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ කළමනාකරණ උපාධියක්,

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය විභාගය සමත්වීම හෝ කළමනාකරණ ගණකාධිකාරි වරලත් ආයතනයේ (CIMA) I හා II කොටස් විභාග / සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) I හා II කොටස් විභාග සමත්වීම,

**සමග**

ගිණුම්කරණ හා මූලය ක්ෂේත්‍රයේ, රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ JEDB ආයතනයට පිළිගත හැකි පෞද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන්, සුදුසුකම් ලැබීමෙන් පසු විධායක තලයේ වසර තුනක (03) පළපුරුද්ද.

**සටහන :** පරිගණකගත ගිණුම්කරණ පරිසරයක කටයුතු කොට තිබීම නිශ්චිතව වාසිදයක වනු ඇත.

## 03. නීති නිලධාරී (කොන්ත්‍රාත්)

අදාළ අයදුම්කරු, එන්තරවාසි, අපහාස පිරික්සුම් කරුණු, අභියාචනා හා ප්‍රතිශෝධන නඩු, මූලික අයිතිවාසිකම් පිළිබඳ සිදුවීම්, ඉඩම් නඩු හා සිදුවීම් ඉහත කරුණු සම්බන්ධව උසාවියේ පෙනී සිටීම, ගිවිසුම් සකස් කිරීම, කොන්ත්‍රාත්, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අනෙකුත් නෛතික කෙටුම්පත් සම්බන්ධව කටයුතු කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

අයදුම්කරු, නීතිඥවරයකු හා ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විය යුතුය.

පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති ප්‍රථම උපාධියක් (LLB) ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

අවම වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සමග සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් කටයුතු සිදුකිරීමට බලතල ලබාතිබිය යුතුය.

ගිවිසුම් කෙටුම්පත් කිරීමට ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

කම්කරු ප්‍රශ්න, කම්කරු විනිශ්චය මණ්ඩල, කම්කරු විමර්ශන කටයුතු හා ඉඩම් සම්බන්ධ නඩු / ගැටලු පිළිබඳ කටයුතු කිරීමේ පළපුරුද්ද සතු අයදුම්කරුවන්හට ප්‍රමුඛතාවය හිමිවේ.

## 04. සහකාර අධිකාරී (කොන්ත්‍රාත්)

තේ රබර් හා පොල් වගා කටයුතු හා නිෂ්පාදන ක්‍රියාකාරකම් සම්බන්ධව හා කම්කරු කළමනාකරණය පිළිබඳ අධිකාරීවරයාහට සහාය විය යුතු අතර, අදාළ තොරතුරු, කලින් කලට, කළමනාකාරීත්වයට ලබාදිය යුතුය.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

රජය පිළිගත් ආයතනයකින් (උදා : NIPM) වැවිලි කළමනාකරණය / කෘෂිකර්මය හෝ නිෂ්පාදන කළමනාකරණ ඩිප්ලෝමාවක් ලබාතිබිය යුතුය.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද තිබිය යුතුය.

**වැටුප් හා දීමනා**

සාකච්ඡා කළ හැක. සුදුසු අයදුම්කරුවන්හට ආකර්ෂණීය වැටුපක් හා ආන්තික ප්‍රතිලාභ හිමිවේ.

**වයස :**

තනතුරු 01 සිට 03 දක්වා –

අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය.

තනතුර 04 සඳහා –

අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**අයදුම්පත් :**

අයදුම්පත්, අදාළ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ හා අනෙකුත් සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපැලෙන්, සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02 යන ලිපිනයට, ලියාපදිංචි තැපැලෙන්, 2021.12.10 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්කරනු ලබන තනතුර, අදාළ අයදුම්පත බහලු කවරයේ වම් ඉහළ කෙළවරේ කැපිටල් අකුරින් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හා ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. මේ සම්බන්ධව යම් බලපෑම් සිදුකිරීම නුසුදුසුකමක් සේ සැලකීමට හේතුවනු ඇත. කෙටි ලැයිස්තුගත සුදුසුකම්ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.

**සභාපති,**
**ජනතා වතු සංවර්ධන මණ්ඩලය,**

**2021.11.22**